# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1911/14 - 2015 අප්‍රේල් මස 24 වැනි සිකුරාදා - 2015.04.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

2011 අංක 02 දරන ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලන හා අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(3)(අ)(i) උප වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

02. 2011 අංක 02 දරන ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය හා අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(3)(අ)(i) උප වගන්තිය යටතේ, ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සමාජ සුභ සාධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන, ප්‍රවාහන හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය, හරීන් ප්‍රනාන්දු වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රාදේශීය සභාවේ විධායක ප්‍රධානියා (සභාපතිවරයා) වශයෙන් රාජපක්ෂ මුදියන්සේලාගේ අබේසේකර මහතාට පැවරී ඇති වැඩ 2015.04.22 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවනු ලැබේ.

03. 2011 අංක 02 දරන ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතන පරිපාලන හා අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(3)(අ) i උප වගන්තිය යටතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රාදේශීය සභාවේ විධායක ප්‍රධානියාගේ වැඩ අත්හිටුවා ඇති හෙයින්, එහි බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්යය ඉටු කිරීමට බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් කටයුතු කරන හේරත් මුදියන්සේලාගේ ජයතිලක මහතාට පෙර කී ප්‍රඥප්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් විධාන කරනු ලැබේ.

හරීන් ප්‍රනාන්දු,
ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සමාජ සුභ සාධන සහ
ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන, ප්‍රවාහන හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය.

05 - 165

1A - PG 2440 — 11 (2015/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*